15. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතුව තිබෙන සියළුම දැන්වීම පුද්ගලික වශයෙන් ඔහු අතට යෙදුව හොත්, හෝ ඔහුගේ ලිපිනය වන ..................................................................................... ..................................................................................................................................... යෙහි තිබෙන්නට යෙදුනහොත් හෝ ඒ ස්ථානයට තැපැල් කරන්නට යෙදුනහොත් හෝ ඒවා ඔහුට භාරදෙන ලද්දේ යැයි සැලකිය යුතුය. ප්‍රාදේශිය ලේකම් ලියවිල්ලකින් කැමැත්ත ඇතිව මිස එසේ නොමැතිව මෙම කොන්ත්‍රාත්තුව වෙනයම් අයෙකුට පැවරීමට කොන්ත්‍රාත්කරුට අයිතිවාසිකමක් නැත්තේය.

16. රුපියල් පත්ලක්ෂයකට අඩුව වැය වන කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් පැන නගින ආරවුල් පිළිබඳ වගන්ති,

- ❖ මේ ගිවිසුමට අදාලව හෝ මෙහි ඇතුලත් කාරණා සම්බන්ධයෙන්, නැතහොත් පිළිවෙලින් එයින් පැන නගින්නාවූ හෝ ඒ සම්බන්ධ හෝ අර්ථය තේරුම් ගැනීම පිළිබඳ හෝ වෙනයම් ආකාරයකින් හෝ මෙහි පාර්ශවකරුවන් අතර, කවර අවස්ථාවකදී වුවද හටගන්නා වූ සියළුම මතභේද හා ආරවුල් බේරුම් කිරීම පිණිස ප්‍රාදේශිය ලේකම්වරුන් භාර අමාත්‍යාශයේ ලේකම් විසින් පත්කරනු ලැබූ තනි බේරුම්කාරයෙකු වෙත එම ආරවුල ඉදිරිපත් කල යුතුය.එසේ පත්කරන ලද බේරුම්කරුගේ තීරණයට මෙහි පාර්ශවකාරයන් බැදෙනු ඇත.
- ❖ කොන්ත්‍රාත්කරුගේ එකඟවීම පිණිස බේරුම්කරුගේ නම ඔහුට දන්වා යැවෙනු ඇත.ලේකම් විසින් පත්කරන බේරුම්කරු ගැන එකඟවීම කොන්ත්‍රාත් ප්‍රතික්ෂේප කරයි නම් තමා සුදුසුයැයි හැඟෙන බේරුම්කරුවෙකු ලේකම් විසින් පත්කළ යුතුය.මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය ලබාගැනීම අවශ්‍ය නොවන්නේය.

17. නියමිත පිරිවිතරයන්ට අනුව සකස් කරන ලද නාම පුවරුව ව්‍යාපෘතියේ කටයුතු අවසන් කළ වහාම අදාල ස්ථානයේ සවි කිරීම.

18. ව්‍යාපෘතියේ කටයුතු සඳහා ................ ශ්‍රම දායකත්වය කාර්මික නිලධාරීගේ අධීක්ෂණය යටතේ ලබා ගත යුතුය.

19. මෙම ගිවිසුමට පරිපාලන වියදම් ඇතුලත් කර නොමැත.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

20. කොන්ත්‍රාත්කරු විසින් ඉටු කරනු ලබන වැඩයේ හෝ ඉන් කොටසක ගුණාත්මක තත්වය තහවුරු කිරීම පිණිස පහත සඳහන් කරුණු ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටිය යුතුය.

(අ) ප්‍රාදේශිය ලේකම් විසින් නිසි පරිදි බලය පවරා ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලබන නිලධාරියෙකු/නිලධාරිණියකගේ අධීක්ෂණය යටතේ මිස වැඩය සම්පූර්ණයෙන්ම හෝ වැඩයේ කොටසක හෝ සම්පූර්ණ නොකළ යුතුය.

(ආ) I සම්පූර්ණ වැඩය හෝ ඉන් කොටසක් කොන්ක්‍රීට් කිරීමකින් සමන්විත වන්නේ නම් එම කොන්ක්‍රීට් කිරීම් කටයුතු නිම වී දින 07 කදී හා දින 28 කදී ලබාගත් සාම්පල රජය විසින් පිළිගත් ආයතනයක් වෙතින් පරීක්ෂා කර බලා දෙනු ලබන කොන්ක්‍රීට් වල ශක්තිමත් භාවය පිළිබඳ සහතිකයක් බිල්පත් සමඟ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශිය ලේකම් වෙත නිසි පරිදි ඉදිකිරිපත් කළ යුතුය.

II මාර්ග තලයන් කොන්ක්‍රීට් කරමින් සිදු කරන මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ඉටු කල යුතු වැඩය හෝ ඉන් කොටසක් වන්නේ නම් එම කොන්ක්‍රීට් ඇතුරුමෙ ඝනත්වය සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් විසින් නිසි පරිදි බලය ලබා දී එම ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීමට පත් කළ කාර්මික නිලධාරියා ඉදිරියේ Core cutterය භාවිතයෙන් අහඹු ලෙස ලබා ගත් කොන්ක්‍රීට් සාම්පල ප්‍රමාණයන් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශිය ලේකම් වෙත සහතික කොට ඉදිරිපත් කළ යුතුය.



CS CamScanner

(ඇ) I ව්‍යාපෘතිය/වැඩය හෝ ඉන් කොටසක් සඳහා යොදා ගන්නා සියලුම අමුද්‍රව්‍ය රජය විසින් පිළිගත් නිත්‍යානුකූල සැපයුම්කරුවන්ගෙන් පමණක් සපයා ගත යුතු අතර එසේ සපයා ගත් බවට වන බිල්පත් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

II ව්‍යාපෘතිය/වැඩය හෝ ඉන් කොටසක් ඉදි කිරීම සඳහා වැඩ බිමට සපයා ගෙන ඇති අමුද්‍රව්‍ය වලින් වැඩය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් පත් කර ඇති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ලබාගත් සාම්පල රජය විසින් පිළිගත් ආයතනයක් වෙත ඉදිරිපත් කර ලබා ගන්නා අමුද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳ සහතිකයක් කොන්ත්‍රාත්කරු විසින් වැඩය ආරම්භ කිරීමට ප්‍රථම ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

මීට සාක්ෂි වශයෙන් එකී කොන්ත්‍රාත්කරුද, එකී ප්‍රාදේශිය ලේකම්ද, ප්‍රාදේශිය ලේකම්ගේ බලය පවරන ලද නිලධාරියා .......................... වර්ෂයේ.............................මස ...............දින මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

කොන්ත්‍රාත්කරු:-

........................................................... සභාපති

........................................................... ලේකම්

ප්‍රාදේශිය ලේකම්,
බඩල්කුඹුර.

(මුද්‍රාව)

සාක්ෂි:-

1. ..........................................................................
2. ..........................................................................

මෙහි පහත සඳහන් වැඩ විස්තර පත්‍රිකාවේ යන්නට (මීට යාකොට ඇති)

(අ) සැලසුම්ද,

(ආ) වැඩ විස්තර පත්‍රිකා ගාස්තු ප්‍රමාණ උප ලේඛණයද,

(ඇ) ගිවිසුම්පතේ දක්වා නැත්තාවූද, මෙම වැඩයට පමණක් විශේෂ වශයෙන් අදාල වන්නා වූ මතු දැක්වෙන කොන්දේසියද ඇතුලත් වන්නේය.



CamScanner